# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.17 පැය 0825 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/455/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. බීඩි සමාගමකට අයත් වෙළඳ ලාංඡනයක් යොදාගනිමින් වංචනික ලෙස බීඩි නිෂ්පාදනය කළ සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

ප්‍රසිද්ධ බීඩි සමාගමකට අයත් වෙළඳ ලාංඡනයක් වංචනික ලෙස උපයෝගී කරගනිමින් බීඩි නිෂ්පාදනයකර වෙළඳපොලට මුදාහැරීමක් සම්බන්ධව මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2026.03.16 වන දින වැටලීමක් සිදුකර මෙම වෙළඳ ලාංඡනය වංචනික ලෙස ලෙස යොදාගනිමින් බීඩි නිෂ්පාදනය කර අලෙවි කල සැකකරුවන් සිව්දෙනෙකු ව්‍යාජ ලෙස නිෂ්පාදනය කල බීඩි තොගයක් සමඟ අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් වයස අවුරුදු 31 ත් 62 ත් අතර වයස්වල පසුවන පමුණුගම නාරන්ගොඩ හා කිඹුලාපිටිය යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මරණ දඬුවම නියමවී තිබූ විවෘත වරෙන්තුකරුවෙකු අත්අඩංගුවට - ඇල්පිටිය පොලිස් ස්ථානය.**

2003.03.05 වන දින ඇල්පිටිය පොලිස් වසමේ දිවිතුරුවත්ත ප්‍රදේශයේදී මනුෂ්‍ය ඝාතනයක් සිදුකර කැබ් රථයක් කොල්ලකෑමේ සිද්ධියකට අදාලව වරදකරුවී සිටි චූදිතයෙකුට බලපිටිය ගරු මහාධිකරණය මගින් මරණ දඬුවම නියමවී තිබිණි.

ඇල්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරකට අනුව මෙම චූදිත වන විවෘත වරෙන්තුකරු 2026.03.16 වන දින සවස පත්තිනිගමුව ප්‍රදේශයේදී ඇල්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**වරෙන්තුකරු වයස අවුරුදු 44 ක් වන පුවක්ගොඩැල්ල, ඇල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

## 03. බස් රථයකට යටවී පදිකයෙකු ජීවිතක්ෂයට - වැල්ලම්පිටිය පොලිස් වසම.

2026.03.16 දින සවස් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ අවිස්සාවේල්ල කොළඹ මාර්ගයේ මහබුත්ගමුව ප්‍රදේශයේදී අවිස්සාවේල්ල දෙසට ධාවනය වූ බස් රථයක් බස් නැවතුමෙහි නවතා මගීන් බස්සවා නැවත ඉදිරියට ධාවනය කිරීමේදී බස් රථයට ඉදිරියෙන් මාර්ගය හරහා ගමන් කළ පදිකයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවරුදු 66 ක් වූ මහබුත්ගමුව, අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ බස්රථ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**